ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 ජුනි 07 වැනි දින |

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 ජුනි**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑතකදී ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට මූල්‍ය වෙළෙඳපොළ ප්‍රතිචාර දක්වමින් සිටින අතර, අදාළ මූල්‍ය ආයතන අපේක්ෂිත සංශෝධන ක්‍රමිකව සිදුකරමින් පවතී. 2013 මැයි මස ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50 කින් පහළ දැමීම ප්‍රධාන වාණිජ බැංකුවල පොලී අනුපාතික තුළින් දැනටමත් පිළිබිඹු වන අතර, බරිත සාමාන්‍ය ඒක්ෂණ ණය අනුපාතිකය මෙන්ම බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය ද අඩු වී ඇත. දිගුකාලීන ණය වර්ධනය තිරසාර ලෙස ඉහළ නංවමින් ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා 2012 දෙසැම්බර් මස සිට මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම නුදුරු කාලයේ දී ණය දීමේ අනුපාතිකයන් වෙත සුමට ලෙස සම්ප්‍රේෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පුළුල් මුදල් හි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය පෙර මාසයේ වූ සියයට 15.6 සිට 2013 අප්‍රේල් මාසය වන විට සියයට 15.2 දක්වා තවදුරටත් මන්දගාමී විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමස්ත මුදල් ප්‍රසාරණය මුදල් වැඩසටහනේ වසර සඳහා අපේක්ෂා කළ මට්ටමේ පවතී. මෙම සමස්ත මුදල් ප්‍රසාරණය තුළ වසරේ පළමු මාස 4 තුළ දී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබාදුන් ණය ප්‍රමාණයට සාපේක්ෂව දේශීය ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් රාජ්‍ය අංශය විසින් අවශෝෂණය කර ගන්නා ලදී. ඉහළ පදනම් බලපෑම අර්ධ වශයෙන් පිළිබිඹු කරමින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය පෙර මාසයේ දී වූ සියයට 10.9 සිට

2013 අප්‍රේල් මාසයේ දී සියයට 10.2 දක්වා මන්දගාමී විය. මේ අතර, පෞද්ගලික අංශයේ දිගුකාලීන ණය වර්ධනයට අවශ්‍ය උත්තේජනය ලබාදෙමින් වසරේ ඉතිරි කාලය තුළ දී රාජ්‍ය අංශයෙහි ණය ගැනීම්හි අපේක්ෂිත අඩු වීම සහ වෙළෙඳපොළ ණය පොලී අනුපාතික පහළ යාමත් සමගම 2013 වසර තුළ දී වාණිජ බැංකු විසින් ලබාදෙන සමස්ත ණය සංයුතියෙහි යම් වෙනසක් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතරම, ප්‍රධාන වශයෙන් මෑතකදී විදුලිබල මිල ගණන්හි සිදුකරන ලද සංශෝධනයන් හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත මතුපිට උද්ධමනය වසරක කාලයක් තුළ පැවති අවම අගය වූ 2013 අප්‍රේල් මස පැවති සියයට 6.4 සිට 2013 මැයි මාසයේ දී සියයට 7.3 දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත මූලික උද්ධමනය පෙබරවාරි මස සිට දක්නට ලද පහත යාම තවදුරටත් එලෙසම පවත්වා ගනිමින් මැයි මාසයේ දී සියයට 5.7 ක් ලෙස වාර්තා වූ අතර, මේ දක්වා මතුපිට උද්ධමනය හා මූලික උද්ධමනය යන දෙකම අඛණ්ඩව මාස 52 ක් තුළ තනි අංකයක පැවතුණි. ඉදිරි කාලයේ දී ද සැපයුම් අංශයේ හිතකර වර්ධනයන් මෙන්ම ඉල්ලුමෙන් ඇදුනු උද්ධමන පීඩනයන් නොමැති වීම හේතුවෙන් උද්ධමනය තවදුරටත් තනි අංකයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විදේශීය අංශය සලකන විට, ගෙවුම් තුලනය වසර තුළ දී මේ දක්වා තවදුරටත් අතිරික්තයක්ව පැවති අතර, 2013 දී විදේශීය අංශයේ ඉලක්ක සපුරාලමින් ගෙවුම් තුලනය තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වසර තුළ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් ශුද්ධ පදනම මත එ.ජ.ඩොලර් මිලියන 580 ක් පමණ අවශෝෂණය කරන ලද අතර, ඉහළ ගිය සේවා වෙළෙඳාමෙන් ලද ඉපැයීම්, ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ සහ ආයෝජන ලැබීම් මේ සඳහා ඉවහල් විය. මෙම වර්ධනයන් දළ නිල සංචිත 2013 අප්‍රේල් අවසානයේ දී ආනයනික මාස 4.4 කට සමාන අගයක් ගනිමින් එ.ජ.ඩොලර් බිලියන 6.9 ක් දක්වා ඉහළ යාමට හේතු වූ අතර මේ සමගම වසර තුළ දී ප්‍රධාන මුදල් ඒකකයන්ට සාපේක්ෂව රුපියල ශක්තිමත් විය.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය 2013 ජුනි 06 වැනි දින පැවැති රැස්වීමේදී දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් එලෙසම පවත්වා ගැනීම සුදුසුයැයි තීරණය කළ අතර, මේ අනුව මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික සියයට 7.00 සහ සියයට 9.00 ලෙස තවදුරටත් පවත්වා ගනු ඇත.

ඉදිරියට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.